# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023**
**2025 සැප්තැම්බර් / ඔක්තෝබර්**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ දර්ශනය
**(නව නිර්දේශය)**

**බෞද්ධ මනෝ විග්‍රහය හා අභිධර්ම අධ්‍යයනය - BUPH 28214**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බෞද්ධ මනෝවිග්‍රහයේ දී ප්‍රතීත්‍යසමුත්පාදය පිළිබඳ ඉගැන්වීම් න්‍යායාත්මක ප්‍රවේශයක් වශයෙන් වැදගත් වන ආකාරය ගෙනහැර දක්වන්න.

02. **විඤ්ඤාණ** යන්නෙහි අර්ථය විශද කරමින්, එය බෞද්ධ ඉගැන්වීම් තුළ වැදගත් වන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

03. සිතෙහි ක්‍රියාකාරිත්වය පුද්ගල චර්යා විෂයෙහි බලපවත්වන ආකාරය අදාළ මූලාශ්‍රය ඇසුරින් විස්තර කරන්න.

04. "**අවිජ්ජා පච්චාය සංඛාරා**" යන ඉගැන්වීම පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න.

05. පෞරුෂය යන්නෙහි අර්ථය ගෙනහැර දක්වමින්, ඒ පිළිබඳ බෞද්ධ විග්‍රහය ගෙනහැර දක්වන්න.

06. ථෙරවාද අභිධර්මයේ ප්‍රභවය හා සංවර්ධනය කෙරෙහි ඉවහල් වූ සාධක උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

07. ආභිධම්මික රූප විභාගය අදාළ මූලාශ්‍රය ඇසුරින් ගෙනහැර දක්වන්න.

08. ආභිධම්මික චෛතසික විග්‍රහයෙහි දැක්වෙන **සබ්බචිත්තසාධාරණ** චෛතසික අදාළ මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

09. ආභිධම්මික ද්විසත්‍යය විභාගය යථාර්ථාවබෝධය විෂයෙහි වැදගත් වන ආකාරය ගෙනහැර දක්වන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් විස්තර කරන්න.

    a. පරමාණුවාදය
    b. ධර්මවාදය
    c. ක්ෂණවාදය
    d. සමාපත්ති

***************************